WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

44 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

නැටුම් (දේශීය) I, II
நடனம் (சுதேச) I, II
Dancing (Oriental) I, II

## නැටුම් (දේශීය) II

※ **පළමුවැනි** ප්‍රශ්නය අනිවාර්ය වේ.
※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1. **සියලු ම** ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ **අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.**

   (i) ගද්‍ය සහ පද්‍ය කොටස් දෙකකින් සමන්විත .............................. සී පද ජන ගායනා විශේෂයකි.

   (ii) බෞද්ධාගමික සිද්ධස්ථානවල සිදු කෙරෙන දවුල්, තම්මැට්ටම්, හොරණෑ වාදනය ........................... නමින් හැඳින්වේ.

   (iii) "මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සනට නටත්, ඔවුන්ගේ උඩුකය නග්න වූ අතර යටිකයේ වැඩ ඇමූ වස්ත්‍ර ඇත්තේ ය" යනුවෙන් සටහන් කර ඇත්තේ මහනුවර යුගයේ ලංකාවට පැමිණි ........................... නමැති ලන්දේසි ජාතිකයා විසිනි.

   (iv) ස්වභාව සෞන්දර්ය වර්ණනා, දෙවියන්, විවිධ වස්තූන්, සතුන් ආදී වර්ණනා ........................... ගායනාවලට ඇතුළත් වී ඇත.

   (v) බෞද්ධාගමික උත්සව අවස්ථාවන්හි සුවිසි විවරණ, සත්සති ආදි බුදුගුණ ගායනය කෙරෙන ........................ නර්තනය පත්තිනි දෙවියන් හා බැඳෙන්නකි.

   (vi) උඩරට නර්තන සම්ප්‍රදායේ **අස්නේ** නර්තනය ගායනය ................................ නර්තනයකි.

   (vii) නර්තන සම්ප්‍රදායන් තුනටම පොදු වූ ......................... ශාන්තිකර්මය නවග්‍රහයින් උදෙසා කරනු ලබයි.

   (viii) සිංහල ජන නැටුමේ එන ලී මල්ලිය, දෙමළ ජන නැටුමේ දී ..................................... ලෙස හඳුන්වයි.

   (ix) පහත සඳහන් වාද්‍ය භාණ්ඩ දෙක වාදනය කරනු ලබන නර්තන සම්ප්‍රදායන් **දෙක** නම් කරන්න.
   (අ) පුං - ......................................
   (ආ) එඩැක්ක - ......................................

   (x) පහත දැක්වෙන නාට්‍යමය අවස්ථා ඇතුළත් ශාන්තිකර්ම **දෙක** නම් කරන්න.
   (අ) යක්කම් පහ - ......................................
   (ආ) පොත්කඩේ පාළිය - ......................................

2. (i) තුන් තිතේ තාලයට අයත් (2 + 2 + 3) උඩරට හෝ පහතරට හෝ සබරගමු හෝ බෙර පදයක් ප්‍රස්තාරගත කරන්න.

   (ii) ඉන්ද්‍ර දිසාවට ඉබුල් විමානෙට .... යන ග්‍රහපන්තියේ කවි පාදයක් ප්‍රස්තාරගත කරන්න.

   (iii) සිංහරාජ වන්නම හෝ අනුරාගදණ්ඩ තාලය සිංදු වන්නම හෝ විරාඩි වන්නමට හෝ අයත් අඩව්වක්/ඉරට්ටියක් ප්‍රස්තාරගත කරන්න.

3. පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

   (i) ගැමි නැටුම්
   (ii) රසභාව සංකල්පය
   (iii) සරල අංග රචනය
   (iv) වන්නම්වල පොදු ලක්ෂණ
   (v) මණිපුරි නර්තනයේ රංග වස්ත්‍රාභරණ

[හත්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

WWW.OLEVELAPI.COM




**4.** කොහොඹා කංකාරිය, දෙවොල් මඩුව සහ පහන් මඩුව යන ශාන්තිකර්මවල සමාන මෙන්ම අසමාන ලක්ෂණ ද වේ.

(i) කොහොඹා කංකාරියේ එන ගායනා **රහිත** ශාස්ත්‍රීය නර්තන අංග **දෙකක්** හඳුන්වන්න.

(ii) දෙවොල් මඩුවේ හා පහන් මඩුවේ එන නාට්‍යමය පෙළපාළිවල සමානතා හා අසමානතා වගුගත කරන්න.

(iii) ඉහත ශාන්තිකර්ම අයත් නර්තන සම්ප්‍රදායයන් **දෙකක** වාද්‍ය භාණ්ඩවල ව්‍යුහයේ සමානතා හා අසමානතා විමසුමට ලක් කරන්න.

**5.** පහත රූපරාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) **A** හා **B** රූපවල දැක්වෙන නාටකවල එන චරිත **දෙක** බැගින් නම් කරන්න.

(ii) **C** රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය බිහිවීමට ගැමි නාටකවලින් ලද ආභාසය විස්තර කරන්න.

(iii) **D** රූපයේ දැක්වෙන රංග කලාවේ විකාශනය පිළිබඳව විග්‍රහයක් කරන්න.

**6.** 'නර්තනය' බොහෝ කලාවන්ගෙන් සම්මිශ්‍රණය වී පරිපූර්ණ වූවකි.

(i) චිත්‍ර කලාවෙන් නර්තනයට ඇති ප්‍රතිලාභ කෙටියෙන් විස්තර කරන්න.

(ii) 'නර්තනයක' සාර්ථකත්වය උදෙසා සංගීතයෙන් ලැබෙන සහාය අගයන්න.

(iii) නාට්‍ය කලාවේ භාවාත්මක ප්‍රකාශනය සඳහා නර්තනය යොදාගෙන ඇති ආකාරය විමසුමට ලක් කරන්න.

**7.** මානසික ස්වස්ථතාව පවත්වාගෙන යාමට නර්තනය ද ඉවහල් වේ.

(i) ගීත අනුව නර්තන නිර්මාණය කිරීමේ දී රසවින්දනය වර්ධනය වන ආකාරය ලියා දක්වන්න.

(ii) ඉවසීම පුහුණු කිරීමෙහිලා නර්තනය මගින් ලැබෙන පිටිවහල උදාහරණ සහිතව දක්වන්න.

(iii) නිරෝගී දිවියකට නර්තනයෙන් ලැබෙන සහාය කෙබඳු දැයි විමසන්න.

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...